# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 109/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 21/01/2024 පැය 1220

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරිම.**

**01. 2024.01.20 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 04 | 03 | 86 | 810 | යකඩ බැරල් 06<br>ප්ලාස්ටික් බැරල් 01<br>තඹ දඟර 01<br>ත්‍රීරෝද රථ 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2024.01.20 වන දින සවස් කාලයේ බ්ලූමැන්ඩල් පොලිස් වසමේ කොළඹ 15 ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 ක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන බ්ලූමැන්ඩල් පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වූ කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. බ්ලූමැන්ඩල් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 03. හෙරොයින් හා අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.

2024.01.20 වන දින රාත්‍රී කාලයේ මීනුවන්ගොඩ පොලිස් වසමේ බුරුලපිටිය පල්ලිය ආසන්න ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර හෙරොයින් ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 290 ක් හා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 03 මිලි ග්‍රෑම් 750 ක්, විද්‍යුත් තරාදියක්, මුදල් රුපියල් 28,000/= ක් සන්තකයේ තබා ගෙන යතුරුපැදියකින් ගමන් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මීනුවන්ගොඩ පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වූ උඩුගම්පල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. මීනුවන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුර.

2024.01.20 වන දින සවස් කාලයේ කුරුණෑගල පොලිස් වසමේ කුරුණෑගල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලි ග්‍රෑම් 250 ක්, ජාවාරමෙන් උපයාගන්නා ලද මුදල් රු 13100/= ක් **හා යතුරුපැදියක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කුරුණෑගල පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වූ හිදගොල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. කුරුණෑගල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුර.

2024.01.20 වන දින සවස් කාලයේ ගලඋඩ පොලිස් වසමේ තුන්නෑව ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමග** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගලඋඩ පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වූ හාලිඇල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. ගලඋඩ පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.**